පැතිකඩ



# ඩී.බී.ගේ සාහිත්‍ය සේවාව 12



ආචාර්ය පාලිත ගනේවත්ත

ඩී. බී. කුරුප්පු මහතා 2005 දී 'හැන්දෑවට පායන හිරු' නොහොත් යුගයක අත්දැකීම් නමැති පොත ලියා පළ කළේය. එය ඩී.බී. ගේ ජීවිත කතාවයි. පොතේ මාතෘකාව ගැන අපගේ අවධානය යොමු විය යුතුය. හිරු පායන්නේ හැන්දෑවට නොව හිරු බැස යන්නේ හැන්දෑවටය. ඩී.බී.ගේ ජීවිතයට හිරු

## 'හැන්දෑවට පායන හිරු'

පායා ඇත්තේ ඔහුගේ ජීවිතයේ සැඳෑ සමයේ යයි සිතේ. මේ අදහස් පිළිබිඹු වන කියුම් පොතේ තැනින් තැන දක්නට ලැබේ. මේ පොත ඩී. බී. හඳුන්වා ඇත්තේ 'මගේ කතාව' ලෙසය. පොත මුද්‍රණය භාර දී ඇත්තේ තුන් වන වරට ලිවීමෙන් පසුවය. කලින් දෙවතාවක්ම ලියා හිතවතුන්ට පෙන්වා ඔවුන්ගේ උපදෙස් පිට තුන්වන වරට පොත ලියූ බව පෙරවදනේ ලා ඩී.බී. පවසයි. දෙවරක්ම ලියූ පොතකට තම ජීවිතයේ සිදු වූ හැල හැප්පීම් සම්බන්ධ ද්වේෂය හා වැල් වටාරම් ඇතුළු වී තිබීම නිසාය තුන්වන වරටත් ලියා කිසිවකුටත් නොපෙන්වා මුද්‍රණය කරන්ට කුරුප්පු මහතා තීරණය කර ඇත්තේ.

***<u>ඩී.බී. ගේ නිර්මාණාත්ම හැකියාව ප්‍රකට වන්නේ ඔහුගේ කෙටි කතාවලින් නොව 'හැන්දෑවට පායන හිරු' හෝ 'පීතෘ පාදං' වැනි තම අත්දැකීම් නොසඟවා කියන වර්ණනාත්මක විත්ති වලින් යයි මම සිතමි. එම පොත්වලින් හෙළිවන අව්‍යාජත්වය පාඨකයාගේ සිත් ඇද බැඳ ගනී.</u>***

තමාගේ ජීවන පුවත් ලිවීමෙන් තම සිතට සහනයක් ලැබුණු බවද ඩී.බී. කියයි. මේ කියුමෙන් ධ්වනිත වන්නේ ලේඛකයකු තම නිර්මාණයේ යෙදීමෙන් ලබන ආස්වාදයයි. එය පාඨකයකු එම නිර්මාණය කියවා ලබන ආස්වාදයට වඩා වෙනස්ය.

'හැන්දෑවට පායන හිරු', ඩී.බී. විසින් උපන්දා සිට මේ වනතෙක් තම ජීවිතයේ සිතූ සිතුම්, පැතූ පැතුම්, අදහස්, ලැබූ අත්දැකීම්, හමු වූ පුද්ගලයන් හා හැල හැප්පුම් තුළින් ලැබූ ජීවිත පරිඥානයෙන් බිඳක් පාඨකයන් හමුවේ තැබීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙසය මට පෙනෙන්නේ.

සීතල උඳුවප් මාසයේ උදෑසනක කරුවල කාමරයකදී මෙලොව එළිය දුටු ඩී.බී. උපන් ගෙය පිහිටීම හා උපන් ගම පිළිබඳ ඓතිහාසික තොරතුරුද දන්වයි; දඟකාර කොලු පැටවකු ලෙස සෙක්කුව පැද්ද සැටිත්, බිං කුණ්ඩන් නැට වූ සැටිත් සිහිපත් කරයි; කුඩා අවදියේදී දුටු කුඹුරු ගොවිතැනේ සියළුම අවස්ථා විස්තර කරන කතුවරයා, කමත් භාෂාව ගැන රසවත් තොරතුරුද ගෙන හැර පායි; දෙවොල් මඩුව, පත්තිනි සළඹ, කිරි අම්මාවරුන්ගේ දානය වැනි ගැමි සංස්කෘතික අංග ගැනත් වලකප්පු ගැසීම, පංච දැමීම, ඔන්චිල්ලාව වැනි සිංහල අවුරුදු ක්‍රීඩා ගැනද සඳහන් කරයි.

පාසල් ජීවිතයත්, ගුරුවරුන්ගේ රස කතාත් විස්තර කරන ඩී.බී. අනතුරුව හොරණ තක්ෂිලාවට ඇතුළු වෙයි. එහි දී ඔහු කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාග දෙකෙන්ම දිවයිනේ ප්‍රථම ස්ථානය දිනා ගනියි. තක්ෂිලාවෙන් පසු කොළඹ නාලන්දා විද්‍යලයේ අධ්‍යාපනය ලබන ඩී.බී.ට ශ්‍රී ලංකාවේ අනාගත සමාජ සංස්කෘතික ක්ෂේත්‍රයන්ට බලපෑම් රාශියක් ඇති කළ කලාකරුවන් හා දේශපාලනඥයන් රැසක්ම හමු වේ. විශ්ව විද්‍යාලයෙන් පිට වී කොළඹ ආනන්ද විද්‍යලයේ ගුරු වෘත්තියට බසින ඩී.බී. ඉන්පසු රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කර්මාන්ත අමාත්‍යාංශය, සිමෙන්ති සංස්ථාව, මහජන බැංකුව, ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය හා නාගරික වැඩ සටහන් ඒකකයේද විධායක නිලධරයකු ලෙස සේවය කරයි. මෙම සේවා කාලවලදී ඩී.බී.ට මුණ ගැසුන පුද්ගලයන් අතර රිජ්වේ තිලකරත්න, චිත්‍රානන්ද අබේසේකර, ගුණසේන ගලප්පත්ති, ධර්මසිරි ගමගේ, සී. ටී. ප්‍රනාන්දු, කේ. ජී. කරුණාතිලක, ආර්. පල්ලෙවෙල , මිණිවන් පී. තිලකරත්න, ජේ. ආර්. පී. සූරියප්පෙරුම, කරූ ජයසූරිය, මුල්ලපිටියේ කේ. එච්. ද සිල්වා කිහිප-දෙනෙකි. පොතේ පසු පස කවරයේ මෙසේ සඳහන් කර ඇත.

'මෙම කෘතිය ඩී. බී. කුරුප්පුගේ දිවිසැරියෙන් බිඳක් පමණක් නොව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන දේශපාලන සංස්කෘතික හා සමාජ ඉතිහාසයේද කොටසකි. සිංහල නවකතා වංශාවලියේ අමරණීය පෙම් පුවතක් වූ 'ගොළු හදවත'ට වස්තු බීජය සැපයූ ත්‍රිකෝණ ප්‍රේමයේත් එක් චරිතයකි කුරුප්පු.'

ඩී.බී. ඕස්ට්‍රේලියාවේ පදිංචියට පැමිණියේ පසුගිය සියවසේ අනූව දශකයේදීය. එතැන් සිට මේ දක්වා මෙල්බර්න් නගරය පාදක කොට විවිධ ශ්‍රී ලාංකිකය-න් සමග ඩී.බී. ඇතිකරගත් මිත්‍ර සබඳතා මෙන්ම කලා සාහිත්‍ය නිර්මාණාත්මක තොරතුරු 'හැන්දෑවට පායන හිරු' පොතට ඇතුලත්ය. මේ නිසා මේ පොත මෙල්බර්න් නගරය ප්‍රධාන කොටගත් ඕස්ට්‍රේලියාවේ සිංහල ජන ජීවිතයේ පසුගිය විසි වසර තුළ ඓතිහාසික තොරතුරු ඇතුලත් ලේඛනයක් ලෙසද සැලකීමට පුළුවන.

ඩී.බී. කුරුප්පු මහතා මෙතෙක් ලියා ඇති පොත් සංඛ්‍යාව හතලිහ ඉක්මවා ඇතැයි සිතමි. 2005 වසරේදී 'හැන්දෑවට පායන හිරු' පොත මුද්‍රණයෙන් පිට වන විට විවිධ විෂයයන්ට අදාලව ඩී.බී. ලියූ පොත් සංඛ්‍යාව පොත් තිහතකටත් (30) වැඩි යයි සිතමි. මේ සියළුම පොත්වලට පාදක වූ අත්දැකීම්වලට තුඩු දුන් සිදුවීම් දැන ගත හැකි ක්‍රමයක් 'හැන්දෑවට පායන හිරු' පොතෙන් ඩී.බී. සපයා දී තිබේ. විශේෂයෙන්ම ඩී.බී.ගේ කෙටිකතාවලට පාදක වූ ජීවිත අත්දැකීම් 'හැන්දෑවට පායන හිරු' පොතේ විස්තරාත්මකව හෙළිදරව් කර ඇත.

සාහිත්‍ය කරුවකුගේ පෞද්ගලික අත්දැකීම් ඔහුගේ නිර්මාණ සඳහා උපයෝගී කර ගන්නේ කෙසේද යන්න දැන ගැනීමට මෙය හොඳ පිටුවහලකි. ඩී.බී.ගේ පොතේ මා දකින වැදගත්ම කරුණ මෙය වෙයි

ඩී.බී. ලියා ඇති නවකතාවටත් කෙටි කතා පොත් කිහිපයටත් පාදක වූ අත්දැකීම් 'හැන්දෑවට පායන හිරු' පොතට ඇතුලත්ය. එහෙත් එම සාහිත්‍ය නිර්මාණවලින් ලබන ආස්වාදයට වඩා වැඩි ආස්ව-ාදයක් මා ලැබුවේ ඩී.බී. ගේ ස්වයංචරිතාපදානය් වන හැන්දෑවට පොත කියවීමෙනි. ඩී.බී. ගේ නිර්මාණාත්ම හැකියාව ප්‍රකට වන්නේ ඔහුගේ කෙටි කතාවලින් නොව 'හැන්දෑවට පායන හිරු' හෝ 'පීතෘ පාදං' වැනි තම අත්දැකීම් නොසඟවා කියන වර්ණනාත්මක විත්ති වලින් යයි මම සිතමි. එම පොත්වලින් හෙළිවන අව්‍යාජත්වය පාඨකයාගේ සිත් ඇද බැඳ ගනී.

ඩී.බී.ගේ කෙටිකතා බොහොමයකට ඇතුළත් වී ඇත්තේ ඔහු ලැබූ අත්දැකීම් ඒ විදියෙන්මය. තම පෞද්ගලික අත්දැකීම් වලින් උචිත දේ පමණක් තෝරා බේරා ගෙන ඒ සිදුවීම් සංකලනයෙන් කෙටිකතාවකට උචිත ස්වරූපය ලබාදීම කෙරෙහි ඩී.බී.ගේ අවධානය යොමුව ඇත්තේ ඉතා ස්වල්ප වශයෙනි. මේ බව මම ඩී.බී.ගේ කෙටිකතා




විමසමින් මීට පෙර ලියූ ලිපිවලද සඳහන් කළෙමි. අප කෙටි කතා කියවන්නේ කතුවරයාගේ පෞද්ගලික අත්දැකීම් මේවා යයි සිතමින් නොවේ. එබැවින් කුරුප්පු මහතාගේ කෙටිකතා කියවීමෙන් නොලද හැකි ආස්වාදයක් හා සතුටක් ඔහුගේ 'හැන්දෑවට පායන හිරු' පොත කියවීමෙන් පාඨකයාට ලැබිය හැකි යයි මගේ විශ්වාසයයි.

ඩී.බී. ගේ හැන්දෑවට පොතට බාහිර අත්දැකීම් මෙන්ම ඔහුගේ ජීවිතයේ අභ්‍යන්තර පෞද්ගලික අත්දැකීම්ද ඇතුලත්ය. එය ස්වයං-චරිතාපදා-නයක අගය වැඩි කරයි.

මේ පොතේ ඇති සිදුවීම්, දින වකවානු පිළිබඳ ඇතැම් තොරතුරු පොතක සටහන් කර තබා ගෙන ඒ අනුව ලියූ බවකි පොත කියවීමේදී මට පෙනී ගියේ. ඩී.බී.ගේ මතකය පුදුම සහගතය. මේ පිළිබඳව දිනක් මම ඩී.බී. ගෙන් විමසුවෙමි. ඒ සිදුවීම් හා දින වකවානු පොතක ලියා නොතැබූ බවත්, තම මතක සිත අතගෑමෙන් ලියූ බවත් ඩී.බී. කීවේය. මීට හය වසරකට පෙර 'හැන්දෑවට පායන හිරු' කියවීමේදී ඒ පොතේ සඳහන් පුද්ගල නාම හා පොතේ පිටු ඇතුලත් කර්තෘ සූචියක් මම සම්පා-දනය කළෙමි. 'හැන්දෑවට පායන හිරු' පොත යළිත් වරක් මුද්‍රණයේදී ඒ කර්තෘ සූචිය පාවිච්චියට ගැනීමට පුළුවන. මෙල්බර්න් නුවර සිටින තරුණ කාලාකරුවකු වන වරුණ සාවින්දගේ අගනා පිටකවරයකින් හැන්දෑවට පායන හිරු පොත සැරසී ඇත.

හැන්දෑවට පායන හිරු පොත ලියා පළකර දැන් වසර හයක් ගත වී ඇත. ඒ පොත පිටවූ දින සිට මේ දක්වා ඩී.බී. ලැබූ අත්දැකීම් අනුසාරයෙන් හැන්දෑවට පොතේ දෙවන කොටස කියවීමට අපි ආසාවෙන් බලා සිටිමු.

